**ශීර්ෂය 331 - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 331- සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජූනි 15 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) තැන්පතු

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ තැන්පත් ගෙවීම් හා ශේෂ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

| | විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | පොදු තැන්පත් ගිණුම් 05 ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය සහ දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් කාර්යාලවල උපලේඛන අනුව ශේෂය අතර රු 124,709,327 වෙනසක් නිරීක්ෂණය විය. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට ශේෂ සැසදීම් වාර්තා තුලනය කර ඉදිරිපත් කිරීමේදී මෙම වෙනස හඳුනාගැනීමෙන් අනතුරුව දෙපාර්තමේන්තු පොත්වලට ගැලපීමට උපදෙස් ලබා දී ඇත. | වෙනස හඳුනාගෙන දෙපාර්තමේන්තු පොත්වලට ගැලපීමට කටයුතු කල යුතුය. |
| (ii) | පොදු තැන්පතු ලේඛනයේ සටහන් කර ඇති අයිතම 05 ක එකතු වටිනාකම රු.2,392,568,462ක් කේවල ශේෂ ලැයිස්තුවේ ඇතුළත්ව නොතිබුණි. | රු 2,392,568,462 ක ශේෂය සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව යටතේ පවරාගත් කේවල ශේෂ ලැයිස්තුවෙහි ඇතුළත්ව ඇත. එම දෙපාර්තමේන්තුව යටතේ පවරා ගැනීම් වාර්තා කිරීමේ දී මෙම ශේෂය භාණ්ඩාගාරයට වාර්තා වී ඇත. | මෙම ශේෂය කේවල ශේෂ ලැයිස්තුවට ඇතුලත් කිරීමට කටයුතු කල යුතුය. |

#### (ආ) දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2022 ජනවාරි 01 දිනට වටිනාකම රු.900,000 ක් වූ ගලගම සමෘද්ධි බැංකු ඉඩම රු.2,500,000කට තක්සේරු කිරීමෙන් එකතු වූ රු.1,600,000ක අගය මූල්‍ය ප්‍රකාශන වල ජංගම නොවන වත්කම් හා සංචිත යටතේ අඩුවෙන් දක්වා තිබුණි. | 2023 අප්‍රේල් මස එම වටිනාකම ගිණුම්ගත කරන ලදී. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ වල අවශ්‍ය ගැලපීම් කර වත්කම් ශේෂය නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | වටිනාකම රු.5,650,000ක් වූ හිපන්කන්ද ගල්කන්ද ඉඩම සෞඛ්‍ය මධ්‍යස්ථානයක් සඳහා කරන්දෙනිය ප්‍රාදේශිය ලේකම් වෙත පවරා ඇතත් මූල්‍ය ප්‍රකාශන වල ඉඩම් යටතේ තවදුරටත් දක්වා තිබුණි. | 2023 වර්ෂයේ මැයි මස ගිණුම් සාරාංශයෙන් ඉඩම් යටතේ දක්වා ඇති මෙම ශේෂය ඉවත් කිරීමට කටයුතු කරමි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ වල අවශ්‍ය ගැලපීම් කර වත්කම් ශේෂය නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. |
| (iii) | මාතර නිල නිවස පිහිටි ඉඩමේ වටිනාකම වූ රු.7,749,000ක මුදල ඉඩම් යටතේ දක්වා නොතිබුණ | 2022 දෙසැම්බර් 31 දිනට ඉඩම් යටතේ දක්වා තිබූ මාතර නිල නිවස පිහිටි ඉඩමේ වටිනාකම වූ රු. 7,749,000 ක මුදල 2023 අප්‍රේල් මස ගිණුම් සාරාංශය මගින් නිල නිවාස යටතට මාරු කර නිවැරදි කර ඇත. | ඉඩම් වටිනාකම මූල්‍ය ප්‍රකාශ වල ඇතුලත් කල යුතුය. |
| (iv) | වැය විෂය අංක 1205 යටතේ මිලදීගත් රු.115,000ක් වූ විදුලි උපකරණ (Microwave Oven) වල වටිනාකම රු1,150,000ක් ලෙස විදුලි උපකරණ යටතේ දක්වා තිබුණි. | විදුලි උපකරණ වටිනාකම 2022 දෙසැම්බර් 31 දිනට ගිණුම්ගත කිරීමේ දී සිදුව තිබූ මෙම දෝෂය 2023 අප්‍රේල් මස ගිණුම් සරාංශය මගින් නිවැරදි කර ඇත. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ වල අවශ්‍ය ගැලපීම් කර වත්කම් ශේෂය නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳව වූ සැසඳුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට සේවකයින් 100 දෙනෙකුගෙන් වසර 01 සිට වසර 05 ඉක්මවූ හිඟ හිටි ණය ශේෂය රු.2,467,073 ක් විය. මෙම ණය ශේෂය තුළ වසර 05 ඉක්ම වූ ශේෂය රු. 302,233 ක් ද වසර 4 ත් 5 ත් අතර හිග හිටි ශේෂය රු. 922,180 ක් ද වසර 3-4 අතර හිග හිටි ණය ශේෂය රු. 321,336 ක් ද වසර 1-3 අතර හිඟහිටි ශේෂය රු.921,324 ක් ද වශයෙන් පැවතුණි. | මෙම නිරීක්ෂණයෙහි සඳහන් ශේෂයෙන් රු. 742,759 ක මුදලක් 2023 ජනවාරි 31 දිනට අය වී ඇත. ඉතිරි හිඟහිටි ණය ශේෂ ද අයකර ගැනීමට කටයුතු කරමින් පවතී | අයකර ගැනීමට නොහැකි ණය ශේෂ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |

## 2.2 සීමා නොපිලිපැදීම

රජයේ අත්තිකාරම් කාර්යයන් සඳහා පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්ට ළගා නොවීම් පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු අනුව අවම ලැබීම් සීමාව රු.280,000,000 ක් වුවත් සත්‍ය වශයෙන් ලැබී ඇති මුදල රු.222,888,467ක් වුයෙන් ලැබීම් වල අවම සීමාවට ළගාවී නොතිබු වටිනාකම රු.57,111,533ක් විය. | අත්තිකාරම් බී ගිණුමේ සීමා තිරණය කිරිමේදී දක්වා ඇති සියළු කරුණු සලකා බලා අදාළ සීමාවන් තීරණය කර ඇත. අපේක්ෂිත සීමාවන්ට ලගාවිමට 2022 වසර තුළ නොහැකිවීමට ප්‍රධානම හේතුව භාණ්ඩාගාර චක්‍රලේඛ ප්‍රකාරව ණය නිකුත් කිරිම් සිමා වීම හා ගෙවිම් සඳහා අක්මුදල් නොලැබිමය. | අත්තිකාරම් සීමා සංශෝධනය කිරිමට අනුමැතිය ලබාගෙන සංශෝධනය කිරිමට කටයුතු කළ යුතුය. |

## 2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැය විෂය අංක 331-1-1-1202 හා 331-2-2-1402 යටතේ වෙනත් ආයතන වලට ගෙවිය යුතු එකතුව රු947,730ක් බැරකම් ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි. | බැරකම් ලේඛනගත කිරීමේදී සිදුව තිබූ අතපසුවීමකි. මෙම බැරකම ලේඛනගත කිරීමට කටයුතු කරන ලදී. | බැරකම් නිවැරදිව හඳුනාගෙන ලේඛණගත කල යුතුය. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු3,045,956 බැදීම් හා බැරකම් වටිනාකම් වැය ලෙජරයේ පෙර වර්ෂ ගිණුම්ගත බැදීම් යටතේ දක්වා නොතිබුණි. | වැය ලෙජරයේ සංශෝධනයන්ට අදාල සටහන් යොදා පෙර වර්ෂයේ ගිණුම්ගත බැදීම් යටතේ නිරීක්ෂණයේ දක්වා ඇති වියදම් සටහන් කර නිවැරදි කිරීමට කටයුතු කරමි. | පෙර වර්ෂ ගිණුම්ගත බැදීම් බැරකම් ලේඛණයේ සටහන් කල යුතුය. |
| (ඇ) | 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයට පටහැනිව දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා ගෙවිය යුතු බැරකම් වටිනාකම රු125,521ක් බැරකම් යටතේ දක්වා තිබුණි. | ඉකුත් වර්ෂයේ අනෙකුත් ගෙවීම් වෙනුවෙන් වන වියදම ප්‍රවර්තන වර්ෂයේ වැය විෂය ප්‍රතිපාදනයෙන් දැරීම සඳහා අවශ්‍ය බලය ලබා ගැනීමේ පදනම මත මෙම ගෙවීම් බැරකම් ලෙස ඇතුළත් කර ඇත | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 2.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණ සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| නිරීක්ෂණය | දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය පිළිබද සමාලෝචනය කර අභ්‍යන්තර පරිපාලන ක්‍රමවේදයන්ගේ වෙනස්කම් සිදු කර ඇතත් එම තොරතුරු ලිඛිතව දන්වා නොමැත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | නිරීක්ෂණය වටිනාකම රු. | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| | **(i)** මුදල් රෙගුලාසි 135 හා 381 (i) | - | පුහුණු මධ්‍යස්ථාන 03 ක භාණ්ඩාගාර අනුමැතියෙන් තොරව බැංකු | පුහුණු මධ්‍යස්ථාන සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | ජංගම ගිණුම් පවත්වා ගෙනගොස් තිබුණි. | අනුමැතිය යටතේ නව බැංකු ගිණුම් විවෘත කිරීම සඳහා අවශ්‍ය සියළු ලේඛන මේ වනවිට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. | |
| | **(ii)** මුදල් රෙගුලාසි 206(3) හා (1) | 1,388,691,509 | තැන්පතුවකින් ගෙවීම සඳහා සෑම වවුචරයක්ම නිලධාරීන් දෙදෙනෙකු විසින් සහතික කළ යුතු වුවත් 2022 නොවැම්බර්, දෙසැම්බර් මාසවලට අදාළව එක් නිලධාරියෙකු විසින් ගෙවීම් වවුචර් 50 ක් සහතික කර තිබුණි. | පොදු තැන්පතු ගෙවීම් කරනු ලබන සෑම අවස්ථාවකම බලය ලත් නිලධාරීන් දෙදෙනකුගේ අත්සන ලබාගැනීමකින් තොරව ගෙවීම් සඳහා අදාල වවුචර් ඉදිරිපත් නොකරන ලෙස විෂය නිලධාරීන් දැනුවත් කරමින් යළි එවන් දෝෂ ඇති නොවන ලෙස අභ්‍යන්තර පාලනය විධිමත් කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | - | 2019 වර්ෂයේ වාහන සමීක්ෂණය අනුව ධාවනයෙන් ඉවත් කරන ලද, අළුත්වැඩියා කර ධාවන තත්වයට පත්කළ හැකි වාහන 24 ක් අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. | 2019 වර්ෂයේ සමීක්ෂණය අනුව හඳුනා ගන්නා ලද වාහනවලින් ආර්ථික ඵලදායිතාවය මත අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගත හැකි වාහන අලුත්වැඩියා කිරීමටත්, ඵලදායී නොවන අනෙකුත් වාහන 2023 ජූලි 31 දිනට පෙර අපහරණය කිරීමටත් මේ වනවිට සැළසුම් කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඇ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | - | චක්‍රලේඛය ප්‍රකාරව මානව සම්පත් සැලැස්මක් සකස්කර නොතිබූ අතර, සමස්ථ කාර්ය මණ්ඩලය සඳහා කාර්යමණ්ඩල ගිවිසුම් සකස්කර නොතිබුණි. | ප්‍රාග්ධන වියදම් සීමා කිරීමත්, ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබීමත් හේතුවෙන් 2022 වර්ෂය තුළ මෙම චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ නොහැකි විය. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඈ) | 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 2/2020 හි 7.4 ඡේදය හා 2015 ජුනි 24 දිනැති අංක 243/2015 රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය | - | තැන්පතු ගිණුම් කාණ්ඩ සඳහා වන වර්ෂය අවසාන ශේෂයන් සිගාස් වැඩසටහන යටතේ ලබා ගන්නා කේවල ශේෂ ලැයිස්තුව සමග සැසදීම් කර තැන්පතු ගිණුම් කටයුතු පසුවිපරම් කිරීමට සහ විශ්ලේෂණය කිරීම සඳහා ආකෘති පත්‍ර නිසිපරිදි සම්පූර්ණ කර මුදල් වර්ෂයක් අවසානයේ එළඹෙන මුදල් වර්ෂයේ පෙබරවාරි 28 දිනට පෙර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතු වුවත් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | තැන්පතු ශේෂ සැසඳීමේදී හඳුනාගත් යම් යම් වෙනස්කම් නිරවුල් කර ගැනීම සඳහා කටයුතු කළයුතු වූ බැවින් තැන්පත් ගිණුම් කාණ්ඩවල සැසදීම් වාර්තා පෙබරවාරි 28 දිනට ඉදිරිපත් කළ නොහැකි විය. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 2.6 තැන්පත් ශේෂයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2013 අගෝස්තු, සැප්තැම්බර් හා ඔක්තෝබර් මාසයන්හි සහනාධාර ගෙවීම සඳහා එවකට සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් සමෘද්ධි අධිකාරියෙන් ලබාගත් රු.මිලියන 2,374 ක මුදල වසර 08 කටත් අධික කාලයක් ගත වී ඇතත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම ශේෂය පියවීම සඳහා භාණ්ඩාගාරයෙන් ඉල්ලීම් සිදු කර ඇති නමුත් මෙතෙක් එම මුදල් පියවීමට කටයුතු කර නැත. මේවනවිට ඉතිරි මුදල පියවා ගැනීම සඳහා කැබිනට් සංදේශයක් ඉදිරිපත් කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. | මෙම මුදල නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2014 ජූනි 01 සිට 2022 දෙසැම්බර් 30 දක්වා වූ කාලපරිච්ඡේදයට අදාල එකතුව රු.3,221,847ක්වූ රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලේ දායක මුදල් එම අරමුදල වෙත යැවීමට කටයුතු නොකර ගාල්ල දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලයේ තැන්පත් ගිණුමේ රදවා ගෙන තිබුණි. | 2023 පෙබරවාරි මස මෙම මුදල් සම්බන්ධයෙන් ක්‍රියාකළ යුතු ආකාරය පිළිබඳව උපදෙස් ලැබී ඇති බැවින් මෙම ගෙවීම් සඳහා අක් මුදල් ලැබීමෙන් අනතුරුව අදාල මුදල සේවක අර්ථසාධක අරමුදලට යොමු කිරීමට කටයුතු කරමි. | දායක මුදල් එම අරමුදල වෙත නොපමාව යැවීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | ලෝක බැංකු ආධාර යටතේ 2022 මැයි, ජූනි, ජූලි මාසයන්හි සමෘද්ධි/ වැඩිහිටි/ආබාධිත සහ වකුගඩු රෝගී පොරොත්තු ලේඛනගත ප්‍රතිලාභීන්ට ගෙවීම් කිරිම සඳහා සමෘද්ධි බැංකු වෙත 2022 මැයි - අගෝස්තු කාලපරිච්ඡේදය තුල බැර කරන ලද රු.39,619,307,119ක මුදලින් සහනාධාර ගෙවා ඉතිරිවූ රු.90,318,300ක මුදල ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ආපසු ප්‍රේෂණය කිරීම 2023 අප්‍රේල් 11 දින සිදු කර තිබුණි. | නිරීක්ෂණයෙහි සඳහන් ශේෂය ද ඇතුළත්ව රු93,011,970 ක මුදලක් 2023 අප්‍රේල් 11 දින අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ගෙවීම් කර තැන්පතු ගිණුමේ ශේෂ නිරවුල් කර ඇත. | සහනාධාර ගෙවීමෙන් පසු ඉතිරි වූ ආධාර මුදල් අප්‍රමාදව භාණ්ඩාගාරය වෙත යැවීමට කටයුතු කල යුතුය . |
| (ඇ) | 2020/21 වර්ෂවල කොවිඩ් සහනාධාර ලබාදීම වෙනුවෙන් දෙපාර්තමේන්තුව යටතේ ඇති අරමුදල්වල ස්ථාවර තැන්පතු ඇපයට තබා ලබාගත් ණය මුදල් සමෘද්ධි ප්‍රජාමූල බැංකු වෙත නිකුත් කර තිබුණි. ප්‍රතිලාභීන්ට සහනාධාර ගෙවීම් කිරීමෙන් පසු ඉතිරි වූ මුදල රු.177,731,499ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අරමුදල් වෙත නිදහස් නොකර පොදු තැන්පත් ගිණුමේ රදවාගෙන තිබුණි. | 2021 වර්ෂයේ ලබාගත් ණය වෙනුවෙන් ලංකා බැංකුව සහ මහජන බැංකුව වෙත ගෙවිය යුතු ණය මුදලෙහි පොළී මුදලින් කොටසක් පියවීම සඳහා මෙම ශේෂය යොදා ගැනීමට හැකියාව පවතින බැවින් ඒ සඳහා අවශ්‍ය අක් මුදල් භාණ්ඩාගාරයෙන් ලබාගෙන මෙම ශේෂය නිරවුල් කිරීමට පියවර ගන්නා ලෙස නිලධාරීන් දැනුවත් කර ඇත. | ඉතිරි මුදල් නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2019 මැයි සිට 2021 ජූනි දක්වා කාලය තුළ නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ එකතුව රු.654,589 ක චෙක්පත් 49 ක් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | පොදු තැන්පත් ගිණුමෙහි පවතින නිකුත් කළ නමුත් නිෂ්කාශනය නොවූ රු.654,589ක ශේෂයට අදාල ආදායකයින් එම ගෙවීම් ලබාගැනීම සඳහා මෙතෙක් ඉදිරිපත් වී නොමැති බැවින් මෙම ශේෂය රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කර ඇත. | රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කල යුතුය. |

## 2.7 බැංකු ගිණුම් මෙහෙයවීම

බැංකු ගිණුම් මෙහෙයවීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වු අඩුපාඩු පහත දැක්වේ.

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සේවක ණය චක්‍රිය ගිණුමට අදාල 2022 දෙසැම්බර් බැංකු සැසඳුම් පරික්ෂාවේදි වර්ෂ 04 සිට වර්ෂ 08 දක්වා කාල පරාසයක් තුළ තැන්පත්කල නමුත් උපලබ්ධි නොවූ රු.2,668,654ක් වටිනා චෙක්පත් 84 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණයෙහි දක්වා ඇති ශේෂයන් දෙපාර්තමේන්තුව ආරම්භ කරන අවස්ථාවෙහි ගිණුම් අතර ගැලපීම් කිරීමේදී සිදු වූ දෝෂයන් බවට හදුනාගෙන ඇති අතර එය තහවුරු කර ගැනීම සඳහා තොරතුරු ලබාගැනීමට චෙක්පත් නිකුත් කළ ආයතන වෙත ලිපි යොමු කර ඇත.එම ආයතන වෙතින් තොරතුරු කැඳවීමෙන් අනතුරුව විධිමත් ගිණුම් ක්‍රියාවලි අනුගමනය කර නිවැරදි කිරීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 දැක්ම හා මෙහෙවර

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

| | විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දූප්පත්කම නැති කිරීම මූලික අරමුණු කොට ගෙන පවුල් ඒකකය පදනම් කරගත් සංවර්ධන ව්‍යාපෘති උපයෝගි කරගනිමින්, ආදායම් හා සමාජීය තත්ත්වයන් නගා සිටුවීමෙන් දූප්පත්කම | 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාල සීමාව තුලදී රජය විසින් සමෘද්ධිලාභීන් සවිබල ගැන්වීමේ විවිධ සමෘද්ධි වැඩ සටහන් සඳහා රු මිලියන1260 ක් වැය කර ඇත. | සංවර්ධන වැඩසටහන් කිරීමේදී සවිබලගැන්වීම් පිළිබඳ නිශ්චිත ඉලක්කයක් හඳුනාගෙන කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පිටුදැකිමත්, තරුණ තරුණියන් රටෙහි සංවර්ධන ක්‍රියාදාමයට හා පරිපාලනයට සෘජුවම දායක කරගැනීමටත් සමෘද්ධි ව්‍යාපාරය ආරම්භ කර තිබුණි. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ මෙහෙවරට අදාළව රජය විසින් වාර්ෂිකව මුදල් වැයකරමින් සමෘද්ධි සහනාධාර සහ සමාජ සවිබලගැන්විමේ විවිධ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කර තිබුණි. 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාල සීමාව තුලදී රජය විසින් සමෘද්ධිලාභියා සවිබල ගැන්වීමේ විවිධ සමෘද්ධි සංවර්ධන වැඩසටහන් සඳහා රු. මිලියන1,260 ක් වැයකර තිබුණ ද සවිබලගැන්වීම් පිළිබඳ නිශ්චිත ඉලක්කයක් හඳුනාගෙන නොතිබුණි. | | |
| (ආ) | 1995 වසරේදී සමෘද්ධිලාභීන් ලෙස හඳුනාගත් සමෘද්ධිලාභින් 312,307ක් 2023 වර්ෂය වන විට වසර 29ක් ගතවී ඇතත්, සවිබලගැන්වීමකින් තොරව තවදුරටත් සහනාධාර ලබමින් පැවතුණි. | සමෘද්ධි සහනාධාර ලබන පිරිස අතර වැඩිහිටි/ආබාධිත/නිදන්ගත රෝග ආදියෙන් පෙලෙන සවිබල ගැන්විය නොහැකි පවුල් විශාල ප්‍රමාණයක් මේ තුල ඇතුලත්ව ඇත. | මූලික අරමුණ අනුව සිදුකලයුතු කාර්යයන් හා කර්තව්‍යයන්ට අනුව මෙහෙයුම් කටයුතු සිදු කල යුතුය. |
| (ඇ) | දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව සවිබලගැන්වූ සහනාධාරලාභීන් ලෙස 2020, 2021 හා 2022 වර්ෂ වලදී පිළිවෙලින් 1,958 ක් 18,629 ක් හා 21,189 ක් ලෙස හඳුනා ගෙන තිබුණි. ඒ අනුව වාර්ෂිකව සමෘද්ධිලාභීන් සවිබලගැන්වීම සඳහා රජය විසින් සිදුකරනු ලබන ව්‍යාපෘතිවලට සාපේක්ෂව පසුගිය වර්ෂ තුන තුළ සවිබලගැන්වීම අවම | රටේ පැවති කොවිඩ් හා ආර්ථික අර්බුදය හමුවේ සවිබල ගැන්වීමේ කටයුතු මන්දගාමීව සිදු වුවද මේ සමග ඇති පහත වගුවේ පරිදි 2022 වසරේ සිට සවිබල ගැන්වීම වැඩි වී ඇත. 2023 වසරේ සිට එක් වසරකට අඩු අදායම්ලාභීන් 01 (ග්‍රාම නිළධාරී වසමකින්) බැගින් සවිබල ගැන්වීමේ කටයුතු කර ඇත. | නිශ්චිත ඉලක්කයකට අනුව සවිබලගැන්වීම් සිදු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මට්ටමක පැවතුණි. | | |
| (ඇ) | 2018 අගෝස්තු 20 දිනැති ඩීඑස්ඩී/එච්ඕ/එස්ඩබ්ලිව්/14/ 18/04/18 චක්‍රලේඛය හා 2021 පෙබරවාරි 11 දිනැති ඩීඑස්ඩී/එච්ඕ/එස්ඩබ්ලිව් /14/19/01 චක්‍රලේඛ ප්‍රකාරව සමෘද්ධි සහනාධාර සඳහා සුදුසුකම් නොලබන නිර්නායක තුල වූ පුහුණු ශ්‍රමය හා ශිල්පීය දැනුම උපයෝගිකරගෙන ආදායම් උත්පාදන ව්‍යාපෘතිවල නියැලි සිටින ප්‍රතිලාභීන්ගේ සමෘද්ධි සහනාධාරය ග්‍රාමීය කමිටුවල නිර්දේශ මත ඉවත් කිරිමට කටයුතු කලයුතු වුවත් නියැදි පරික්ෂාවට ලක්වූ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 34 ක ප්‍රතිලාභීන් 1,112ක ගේ සමෘද්ධි සහනාධාරය ඉවත් කිරිමට ග්‍රාමීය කමිටු වල නිර්දේශ ලබාදි නොතිබුණි. | චක්‍රලේඛයේ සඳහන් කරුණු අතුරින් ආදායම් උත්පාදන ක්‍රියාදාමයක් තුළින් ඉහළ ආදායම් උපයන සවිබල ගැන්වී ඇති පවුල් හා ග්‍රාමීය කමිටුව විසින් හඳුනාගනු ලබන සැලකිය යුතු දෛනික ආදායම් ලබන පුහුණු ශ්‍රමිකයන් සහිත පවුල් යන කරුණු වලට අදාලව, සැලකිය යුතු ඉහළ ආදායමක් සහිත සවිබල ගැන්වී ඇති පවුල් වල සහනාධාර ඉවත් කිරිමට උපදෙස් ලබා දී ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව සවිබලගැන්වූවන් හඳුනාගෙන සහනාධාරය ඉවත් කිරීමට කටයුතු කල යුතුය. |
| (ඉ) | 2022 දෙසැම්බර් 31 දිනට ප්‍රජාමූල බැංකු1,089ක සාමාජිකයින්4,115,100ක ගේ මුළු තැන්පත් මුදල රු.බිලියන155.1ක් වන අතර එයින් ප්‍රතිලාභීන්ට ලබාදුන් ණය මුදල්වල පිටහිටි ශේෂය රු. බිලියන68ක් පමණක් විය. 2022 දෙසැම්බර් 31 දිනට රු. බිලියන149ක් ඉහළ පොළී අනුපාත යටතේ ආයෝජනය කර තිබුණු අතර සමෘද්ධිලාභීන්ගේ ඉතිරිකිරීම් සඳහා ගෙවා ඇත්තේ සියයට 03 ක් වැනි අඩු පොළියකි. මේ අනුව සමෘද්ධිලාභීන් සවිබල ගැන්වීම අරමුණු කරගෙන ප්‍රජාමූල බැංකු පද්ධතිය ආරම්භකර තිබුණද, වර්තමානයේදී සමෘද්ධිලාභියා සවිබල ගැන්වීමේ අරමුණෙන් බැහැරව, ලාභ අරමුණින් | සමෘද්ධි බැංකු පද්ධතියේ ණය සඳහා ණය පොලී අනුපාතය අනෙකුත් බැංකු වලට සාපේක්ෂව සියයට 3,5 හා 13 යන අගයන්වේ. මෙහිදී ඉතිරි කිරීම් සඳහා පොලී අනුපාතය සියයට 03 ක ප්‍රමාණයක් ලබා දීමට හේතු වී ඇත්තේ අනිකුත් බැංකු වලට සාපේක්ෂව ණය ලබා දීමේදී පොලී අනුපාතය අඩු අගයක් ගන්නා බැවිනි.<br><br>විගණන වාර්තාවේ පරිදි සමෘද්ධි බැංකු වල අරමුණු වලට පටහැනිව කටයුතු කර නොමැති අතර වාර්ෂිකව මුළු බැංකු පද්ධතිය මගින් පවුල් 350,000ට වැඩි සංඛ්‍යාවකට ණය නිකුත් කරනු ලැබේ. එසේම මෙම ණය ලබා ගන්නා පිරිසෙන් පවුල් 50,000 කට වඩා වැඩි පිරිසක් වාර්ෂිකව තම අදායම වර්ධනය කර ගෙන ඇති බව පෙනේ. නමුත් සමෘද්ධි බැංකු උපරිම ලාභ ලැබීම් සඳහා ක්‍රියාත්මක නොවන අතර මුඛ්‍ය පරමාර්ථය වන්නේ ප්‍රතිලාභීන් | සමෘද්ධිලාභීන් සවිබල ගැන්වීමේ අරමුණෙන් ප්‍රජාමූල බැංකු පද්ධතියේ පවතින අරමුදල් යෙදවීම හැකිතාක් දුරට සිදුකර යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ක්‍රියාත්මක වී ඇති බව හා ලාභදායීත්වය කරා මෙහෙයවීමක් සිදුවන බව නිරීක්ෂණය විය. | සඳහා ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් ලබා දීමයි. එමෙන්ම ණය ඉල්ලීම් පහත වැටීම හේතුවෙන් බැංකු පද්ධතියේ ඉතිරි වන මුදල් අයොජනය කිරීමට කටයුතු කර ඇති අතර එම ආයෝජන වලින් ලැබෙන පොලී ආදායම හේතුවෙන් ලාභ වැඩිවීමට හේතු වී ඇත. | |
| (ඊ) | ප්‍රජාමූල බැංකු වෙත මාසිකව ප්‍රේෂණය කරනු ලබන සමෘද්ධිලාභි සහනාධාර මුදල් ඇතැම් සමෘද්ධිලාභින් විසින් මාසිකව ලබා නොගෙන දිර්ඝ කාලීනව තම බැංකු ගිණුම්වල රඳවා තබා තිබුණි. මේ සම්බන්ධයෙන් කරනු ලැබූ නියැදි විගණන පරික්ෂාවේදී ප්‍රජාමූල බැංකු 10ක වසම් 41ක් තුල සමෘද්ධිලාභීන් 2,433 කගේ ඉතිරි කිරීමේ ගිණුම්වල එසේ රඳවා තිබූ මුදල රු.59,951,537ක් විය. | සමෘද්ධි ප්‍රතිලාභීන්ට මාසිකව මුදල් ප්‍රේෂණය කිරීමෙන් අනතුරුව එහි වගකීමෙන් ආයතනය නිදහස් වන අතර තම ඉතුරුම් ගිණුමට බැරවූ මුදල් ලබා ගැනීම පිළිබඳව සම්පූර්ණ වගකීම එම මුදල් බැර වූ ගිණුම් හිමි ප්‍රතිලාභියා සතුවේ. | සහනාධාර මුදල් බැංකු තුළ රඳවාගැනීමට හේතුන් පරීක්ෂා කර සමෘද්ධිලාභීයා සවිබල ගැන්වී ඇත්නම් සහනාධාරය ඉවත් කිරිමට කටයුතු කළ යුතුය. |

## 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමෘද්ධි විද්‍යුත් අලෙවි ජාලයක් ස්ථාපිත කිරිමට හා සමෘද්ධි නිෂ්පාදන සඳහා ප්‍රමිත සහතික ලබාදීමට වැඩසටහන් 05 ක් පැවැත්වීමට සැලසුම්කර තිබූ නමුත් ක්‍රියාත්මක කර නොතිබුණි. | වර්ෂයේ ප්‍රතිපාදන සීමිත වීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට නොහැකි විය. | සැලසුම්කළ ක්‍රියාකාරකම් නිසි පරිදි ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | කාබනික පොහොර නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන් 15ක් පැවැත්වීමට සැලසුම්කර තිබූ නමුත් වැඩසටහන් 06 ක් පමණක් පවත්වා තිබූ | 2022 වර්ෂයේ අනුමත ක්‍රියාකාරී සැලැස්ම අනුව ජීවනෝපාය සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට වෙන් කල ප්‍රතිපාදන සීමාව තුල දිස්ත්‍රික්ක 22 සඳහා කාබනික පොහොර නිෂ්පාදන වැඩ මුළු සඳහා රු මිලි.2.99 වෙන් කරන | සැලසුම්කළ ක්‍රියාකාරකම් නිසි පරිදි ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අතර ඒ අනුව භෞතික ප්‍රගතිය සියයට 40ක් වී තිබුණි. | ලදී. එසේ වුවද රටේ පැවති අහිතකර ආර්ථික තත්වය හමුවේ වෙන් වූ ප්‍රතිපාදන ප්‍රමාණය නොලැබීම හේතුවෙන් දිස්ත්‍රික්ක 05 ක පමණ මෙම වැඩ මුළු ක්‍රියාත්මක කරන ලදී. | |
| (ඇ) | ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන යටතේ නව සමෘද්ධි ප්‍රජාමූල බැංකු 25ක් සංවර්ධනය කිරිමට රු.මිලියන7ක් වෙන්කර තිබුණි. ඉන් රු. මිලියන 4.90 ක් එනම් ප්‍රතිපාදන මුදලින් සියයට 70ක වියදමින් නව බැංකු 06ක පූර්ණ යටිතල පහසුකම් සංවර්ධනය කර තිබූ අතර බැංකු 09ක යටිතල පහසුකම් සියයට 50ක පමණක් සංවර්ධනය කර තිබුණි. | 2022 වසරේ වෙන් කරන ලද ප්‍රතිපාදන සීමා කිරීම හේතුවෙන් ඉතිරි නව ප්‍රජා මූල බැංකු 09 හි යටිතල පහසුකම් සංවර්ධනයට භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබා නොදුන් අතර සියයට 50 ප්‍රතිශතයකින් එම බැංකුවල යටිතල පහසුකම් සංවර්ධනය කරන ලද්දේ නව බැංකුවට අයත් ග්‍රාම නිලධාරි වසම් අයත්ව තිබූ පැරණි සමෘද්ධි බැංකු වලින් ලබාගත් අරමුදල් මගිනි. | සැලසුම්කළ ක්‍රියාකාරකම් නිසි පරිදි ක්‍රියාත්මක කළ යුතුය. |

**3.3 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දූර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 හා 2018 වර්ෂයන් වල කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කීරගල සමෘද්ධි ආදර්ශ ගම්මානයේ ප්‍රතිලාභීන් 72 කට ව්‍යාපෘති 11 ක් සඳහා රු.1,970,000ක් හා ඕපනායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මල්මිකන්ද සමෘද්ධි ආදර්ශ ගම්මානයේ කිතුල් නිෂ්පාදන සඳහා ප්‍රතිලාභීන් 255 කට රු. 5,824,451ක රජයේ දායකය ලබාදී තිබුණද මෙම ව්‍යාපෘති ආරම්භ කර වර්ෂ 04 ක් ගත වී ඇතත් ආදායම් උත්පාදන පිළිබඳව තොරතුරු ලබාගෙන සව්බලගැන්වීමට ඇති හැකියාව පිළිබඳව පසුවිපරමක් කර නොතිබුණි. | පෙර පැවැති තත්වයට වඩා විධිමත් හා නිවැරදි ක්‍රමෝපායන් භාවිතා කරමින් මෙම කර්මාන්ත පිළිබඳව පසු විපරම් කටයුතු සමෘද්ධි සංවර්ධන නිලධාරින් හා කළමනාකරුවන්ගේ සමීප අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කිරිමට මේ වන විට සැලසුම් සකස් කර ඇති බවත්, ඒ මත පදනම්ව අදාල ප්‍රතිලාභින් ඉදිරියේදි සවිබල ගැන්විමට කටයුතු කෙරේ. | සව්බලගැන්වීමට ඇති හැකියාව පිළිබදව පසුවිපරම් කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 13 කට අයත් සමෘද්ධිලාභින්ගේ ජීවන තත්ත්වය උසස් කිරිම ,නිෂ්පාදන ගම්මාන බිහිකිරිම තුළින් සමෘද්ධි ප්‍රතිලාභීන් සවිබලගැන්වීම සඳහා 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා ගම්පහ දිස්ත්‍රික්කයේ ආදර්ශ ගම්මාන 11 ක් සඳහා දෙපාර්තමේන්තුව විසින් රු. 38,442,329ක් මුදල් වැයකර තිබුණි. විගණනයට ඉදිරිපත් කරන ලද ආදර්ශ ගම්මාන 06 ක්‍රියාත්මක කොට 2020 වර්ෂය වන විට වසර 04 ක් ඉක්මවා තිබුණද ව්‍යාපෘති වලට අදාළ පසුවිපරම් කටයුතු සිදුකර නොතිබුණි. | ජාඇල කල්එලිය රසකැවිලි ආදර්ශ ගම්මානය සඳහා ලබා දුන් රු 2,270,950ක ප්‍රතිපාදන වර්ෂය අවසානයේ ලබා දිම නිසා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමට ප්‍රමාණවත් කාලයක් ඉතිරිව නොමැති බැවින් ක්‍රියාත්මක නොවුණි. ඒ සඳහා ලද ප්‍රතිපාදන අවලංගු වි ඇත. තවද ක්‍රියාත්මක කරන ලද ආදර්ශ ගම්මාන පිළිබඳව පසු විපරම් කටයුතු සමෘද්ධි සංවර්ධන නිලධාරින් හා කළමනාකරුවන්ගේ සමිප අධික්ෂණය යටතේ ක්‍රියාත්මක කිරිමට මේ වන විට සැලසුම් කර ඇත. | සවිබලගැන්වීමට ඇති හැකියාව පිළිබඳව පසුවිපරම් කල යුතුය. |
| (ඇ) | 2017 සිට 2021 දක්වා කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 30 ක් තුළ කර්මාන්ත, අලෙවි, කෘෂි, සත්ත්ව පාලන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිලාභින් 7,986දෙනෙකු වෙනුවෙන් රු.293,281,808ක මුදලක් වැය කර තිබුණි.<br><br>නියැදි පරීක්ෂාවේදි තෝරගන්නා ලද ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 කට අයත් ග්‍රාම නිලධාරි වසම්වල සමෘද්ධි ප්‍රතිලාභීන්ට ලබා දී තිබුණු යෙදවුම් උපකරණ ක්‍රියාත්මක කරන ලද ජීවනෝපාය ආදායම් උත්පාදන ව්‍යාපෘති වලදී එකම ප්‍රතිලාභියාට අවස්ථා දෙකක දී ආදායම් උත්පාදන උපකරණ ලබාදී තිබුණු හා ප්‍රතිලාභියාගේ කර්මාන්තය නිවැරදිව හඳුනා නොගෙන භාණ්ඩ උපකරණ ලබා දුන් අවස්ථා මෙන්ම පෙර වර්ෂයේ කරගෙන යන ලද ව්‍යාපාරයට වෙනස් ආකාරයේ උපකරණ ලබාදී තිබූ අවස්ථාද විය. එසේම උපකරණ ලබාදීමේ දී ප්‍රතිලාභියා උපකරණ ලබා ගන්නේ නව ව්‍යාපෘතියක් සඳහා ද නැතහොත් පැරණි ව්‍යාපෘතිය | වසම් මට්ටමින් කලාප මට්ටමින්, ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් පසු විපරම් කිරිම හා මාසික ප්‍රගති සාකච්ඡා කරමින් ව්‍යාපෘති සාර්ථකව පවත්වා ගෙන යාමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. රටේ පැවැති ආර්ථික ගැටළු හේතුවෙන් අදාල ව්‍යාපෘති වල අපේක්ෂිත මට්ටමේ ප්‍රගතියක් ලබා ගැනිමට අමුද්‍රව්‍ය වල මිල අධික විම, අලෙවි අපහසුතාවය ආදි කරුණු බාධාවක් වි ඇත. අසාර්ථක ව්‍යාපෘති හදුනාගෙන සාර්ථකව ක්‍රියාත්මක ව්‍යාපෘති ලාභින් වෙත ප්‍රතිලාභ දායකත්වය ආපසු අයකර ගෙන නව ගිවිසුමකට අත්සන් කර ව්යාපෘති උපකරණ පවරා දිම සිදු කර ඇත. එය ප්‍රාදේශිය ලේකම් ගේ අනුමැතිය මත සිදු කර ඇත. සාර්ථක ව්‍යාපෘති මගින් ජීවන තත්වය ඉහල ගිය සමෘද්ධිලාභින්ගේ සමෘද්ධි සහනාධාර ඉවත්කිරිම සඳහා වැඩපිළිවෙලක් යොදා ඇත. | අවශ්‍යතාවය හඳුනාගෙන උපකරණ ලබාදීම කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සඳහා ද යන්න පසුවිපරමක් කර නොතිබුණි. | | |
| (ඇ) | 2020 හා 2021 වර්ෂයන් තුළ සුවබොජුන්හල් 04 ක් ඉදිකිරිම සඳහා රු19,748,110ක් වැය කර ඇතත් 2023 මාර්තු දක්වා එම අලෙවිහල් විවෘත කිරිමට නොහැකි වී තිබුණි. හබරාදුව, මතුගම හා කිලිනොච්චි සුව බොජුන්හල් සඳහා තවදුරටත් වැයකිරිමට අපේක්ෂිත මුදල රු.මිලියන19.55ක් බවට ඇස්තමේන්තු සකස් කර ඇතත් මේ සඳහා ප්‍රතිපාදන 2023 වර්ෂයේ සලසා නොතිබුණි. ඒ අනුව අලෙවිහල්වල ඉදිකිරීම් ආරම්භ කොට වසර 02 ක් ගත වී ඇතත් වැඩ අවසන් නොවීමෙන් මෙම අලෙවිසල් නිශ්කාර්යව පවතින බවත් සමෘද්ධි ප්‍රතිලාභීන් සුවබොජුන්හල් වෙත යොමුකර ආදායම් ඉපයීම තුළින් සවිබලගැන්වීමට කටයුතු කර තිබීම ප්‍රමාණවත් නොවන බවත් නිරීක්ෂණය විය. | මේ සඳහා 2023 වර්ෂයේ ප්‍රතිපාදන ලබා දීමට සැලසුම් කර ඇතත් මේ දක්වා භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබා නොදීම හේතුවෙන් වැඩ අවසන් කිරීමට නොහැකිව ඇත. මෙය දෙපාර්තමේන්තුවට පාලනය කළ නොහැකි තත්ත්වයක් වේ. එහෙත් 2020 හා 2021 වර්ෂයන්ට සාපේක්ෂව ඉදිකිරීම් ක්ෂේත්‍රයේ මිල ගණන් වර්තමානයේ ඉතා ඉහල අගයක් ගන්නා බැවින් කලින් කරන ලද වියදම් නිශ්කාර්ය නොවන බවත් ඉතිරි මුදල සපයාගත් වහාම මෙම අලෙවි සැල්වල ඉදි කිරීම් අවසන් කොට ව්‍යවසායිකාවන් සඳහා රැකියා අවස්ථා ලබා දීමට හැකි වනු ඇත. | වත්කම් ඵලදායි ලෙස යොදා ගතයුතු වීම. |

**3.4 වෙනත් නිරික්ෂණ**

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **මූල්‍ය අක්‍රමිකතා** | | |
| | සමෘද්ධි බැංකු හා බැංකු සමිතිවල 2014-2018 කාලය තුල සිදුවූ වටිනාකම රු.115,723,619ක් වූ වංචා 135 ක් පිළිබඳ 2018 සහ 2019 විගණකාධිපති වාර්තාවලින් පෙන්වාදී තිබුණි. 2023 අප්‍රේල් 21 දින විගණනයට ඉදිරිපත් කල තොරතුරු අනුව 2014-2018 කාල පරිච්ඡේදය සඳහා වංචා 15 ක් වෙනුවෙන් රු.63,817,207ක් ද 2019 සිට | මේ වන විට විමර්ෂණ අංශ වෙත වාර්තා වී ඇති මූල්‍ය වංචා සම්බන්ධයෙන් විනය කටයුතු සිදු කර ඇති අතර තමා කළ වරද පිළි ගන්නා නිළධාරීන් සඳහා වංචා කර ඇති මුළු මුදල් ගෙවීමෙන් පසු විනය නියෝග නිකුත් කිරීමට කටයුතු කර ඇත. එසේ නැතහොත් විධිමත් විනය පරීක්ෂණයෙන් පසුව විනය නියෝගය නිකුත් කිරීමේදී වංචා කරන ලද මුළු මුදල අය | වැරදි හා අක්‍රමිකතා අවම වන ලෙස බැංකු පද්ධතිය තුළ මනා අභ්‍යන්තර පාලන පද්ධතියක් නිර්මාණය කර ඵලදායි ලෙස පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 2023 පෙබරවාරි දක්වා වංචා 92 ක් වෙනුවෙන් රු.172,189,227ක් ද හදුනාගෙන තිබුණි. සියළු සමෘද්ධි බැංකු හා බැංකු සමිති පරිගණක ක්‍රියාවලියට යටත් කිරිම සිදු කරමින් ගනුදෙනු කරුවන්ගේ කටයුතු වඩාත් කාර්යක්ෂමව සිදු කිරිමත් එමෙන්ම අතින් (Mannual) සිදු කිරිමේදී සිතාමතා සිදු කරන වැරදි හා මූල්‍ය වංචා අවම කරගැනීමට අපේක්ෂා කලද වාර්තාවී ඇති මූල්‍ය වංචා හා අක්‍රමිකතා ප්‍රමාණාත්මක අගයක් ගෙන තිබුණි. | කිරීමට කටයුතු කරනු ලැබේ. එමෙන්ම විනය නියෝග නිකුත් කිරීමේදී යම් නිලධාරියෙකු සේවයෙන් පහ කිරීමට නියම කරනු ලැබුවහොත් වංචා කරන ලද මුළු මුදල හා දඩ පොළිය අය කර ගැනීම සඳහා නීති මගින් කටයුතු කරනු ඇත. | |
| (ආ) | 2013 අංක 1 දරන දිවිනැගුම ආඥාපනතේ 36 වගන්තිය යටතේ දිවිනැගුම සංවර්ධන අරමුදල පිහිටුවනු ලැබිය යුතු වන අතර දෙපාර්තමේන්තුවට ලැබෙන සියළු ප්‍රදාන, ත්‍යාග පනත යටතේ පිහිටුවන ලද බැංකු හා බැංකු සමිති විසින් ත්‍යාග වෙනත් දායක මුදල්, බැංකු වල ලාභයෙන් අමාත්‍යවරයා නිශ්චය කරනු ලබන මුදල් ප්‍රතිශතයක් වශයෙන් සියළු ලැබීම් ඒකාබද්ධ අරමුදලට බැරකළ යුතු වේ. ඉන් පසුව පාර්ලිමේන්තුවේ අනුමැතිය ඇතිව දිවිනැගුම සංවර්ධන අරමුදලට බැරකල යුතු වුවත් දිවිනැගුම සංවර්ධන අරමුදල මේ දක්වා පිහිටුවා නොතිබුණි. | සමෘද්ධි අරමුදල පිහිටුවීම සම්බන්ධව ගිණුම් ආරම්භ කිරීම සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඉල්ලා ඇති නමුත් මෙතෙක් එම අනුමැතිය ලැබී නැත. | පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව අරමුදල පිහිටුවිය යුතුය. |
| (ඇ) | උක්ත පනතේ 45 වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් අරමුදල් 06 ක් පවත්වාගෙන යනු ලබන අතර සමෘද්ධි අරමුදල හා සේවක ණය චක්‍රීය අරමුදල මේ වන විට අක්‍රීය තත්ත්වයේ පැවතුණි. | සමෘද්ධි අරමුදලේ කාර්යය වන්නේ ආදායම් උත්පාදන වලින් ලැබෙන වාරික හා කුලී ආදායම් ඒකරාශී කිරීම සහ දිවයින පුරා ක්‍රියාත්මක ආදායම් උත්පාදන ව්‍යාපෘතිවලින් ලැබෙන ආදායම ආයෝජනය හා ප්‍රති ආයෝජනය කිරීම වන අතර එම කාර්යයන් අඛණ්ඩව ක්‍රියාත්මක කරමින් පවතී. සේවක ණය චක්‍රීය අරමුදල තවදුරටත් යොදා | අක්‍රීය අරමුදල් ඇවර කොට අරමුදල සතු මුදල් ඒකාබද්ධ අරමුදලට බැරකල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | නොගැනෙන නමුත් එම අරමුදලෙන් ගෙවූ ණය තවදුරටත් අයකරගත යුතුව ඇත. සියළු ණය අයකර එම මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කිරීමෙන් අනතුරුව මෙම ගිණුම ඇවර කිරීමට කටයුතු කරනු ඇත. | |
| (ඈ) | 2020 අගෝස්තු 22 දිනැති අංක 2020/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.2 (ආ) ඡේදය ප්‍රකාරව දැනට පවතින අරමුදල් ක්‍රියාත්මක වීම ජාතික අවශ්‍යතාවයක් බව පෙනියන්නේ නම් එම අරමුදල් පාර්ලිමේන්තු පනතක් මඟින් අනුමත කර ගත යුතු වුවත් සමෘද්ධි ජාතික සමාජ අරමුදල පාර්ලිමේන්තු පනතක් මඟින් අනුමත කර ගැනීමකින් තොරව ක්‍රියාත්මක කර තිබුණි. | 2013 අංක 01 දරණ දිවි නැගුම පනත අනුව දෙපාර්තමේන්තුවක් බවට පත්වූ සමෘද්ධි අධිකාරිය සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තු පණතේ 45 වන වගන්තියට අනුව පවත්වාගෙන එම අරමුදල් එම අරමුණු වෙනුවෙන්ම ප්‍රජා මූල සංවිධාන,ප්‍රාදේශීය සංවිධාන ලෙස පවත්වාගෙන ආ එම සංවිධාන ජාතික සමාජ සංවර්ධන අරමුදල ලෙස ප්‍රජා ව්‍යුහයට සම්බන්ධ කොට ක්‍රියාත්මක කරන බැවින් මෙය නව අරමුදලක් නොවන බව සඳහන් කරමි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඉ) | සමෘද්ධි ජාතික සමාජ සංවර්ධන අරමුදලේ නීත්‍යානුකූල තත්ත්වය විගණනයට ඉදිරිපත් නොවූ අතර අරමුදලේ 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2023 මැයි 22 විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි. ප්‍රජාව තුල සමාජ සාධාරණත්වයක් ඉටු කිරීම සඳහා පිහිටුවා ඇති මෙම අරමුදල මඟින් 2021 හා 2022 වර්ෂයන් තුළ රු 8,481,773ක් වූ ව්‍යාපෘති 03 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි. 2022 දෙසැම්බර් 31 දිනට රු.8,048,684ක ශේෂයක් අරමුදලේ පැවතුණි. 2022 දෙසැම්බර් 31 දක්වා කොඩි විකිණීමෙන් සමිති ලියාපදිංචියෙන් ලද මුදලින් රු.91,000,000ක ස්ථාවර තැන්පතු ශේෂයන් පවත්වා ගෙන ගොස් තිබුන අතර ඒකාබද්ධ | 2017 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන සකස් කොට අවසන් කර ඇත. 2021/2022 යන වර්ෂ වල රටේ පැවති අයහපත් වාතාවරණය තුල කිසිදු සමාජ ක්‍රියාකාරකමක් සිදු කිරිමට නොහැකි වීම අරමුදලට පොදුවේ බලපා ඇත. තවද 2019/2020/2021/2022 යන වර්ෂවල කොඩි අලෙවිය ක්‍රියාත්මක නොවූ අතර 2023 වර්ෂයේ සිට මෙම අරමුදල ඵලදායීව ව්‍යාපෘති සඳහා යෙදවීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරමින් පවතී. | අරමුදලේ අරමුණු ඉටු කරගැනීම සඳහා අරමුදල් ඵලදායී වැඩසටහන් වෙනුවෙන් යෙදවීමට ක්‍රියා කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අරමුදලට බැරකර ඇත්තේ රු.10,000,000ක් පමණක් විය. | | |
| (ඊ) | දිවිනැගුම ප්‍රජාමූල බැංකු හා ප්‍රජාමූල බැංකු සමිති පිළිබඳව මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයාට විගණනය කිරීමට හැකිවන ආකාරයට ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන ඇතිකර පනත සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | 2023 අප්‍රේල් 25 දින පැවති රාජ්‍ය ගිණුම් කාරක සභාවේදී ලබාදෙන ලද උපදෙස් පරිදි ගරු නීතිපති තුමා වෙත 2023 අප්‍රේල් 26 දින ලිපියක් යොමු කරන ලද අතර ඒ මගින් රාජ්‍ය ගිණුම්කාරක සභාව වෙත ඉදිරිපත් කිරීම සඳහා නීතිපතිතුමාගේ මතය කඩිනමින් ලබාදෙන ලෙස ඉල්ලීම් කරන ලදී. | සමෘද්ධි සංවර්ධන පනත සංශෝධනය කිරීමට කටයුතු කල යුතුය. |
| (උ) | සමෘද්ධිලාභීන්ගේ අනිවාර්ය ඉතුරුම් ගිණුම්වල පවතින මුදල් හා විවිධ අරමුණු සඳහා පිහිටුවා ඇති දෙපාර්තමේන්තුවේ පවතින අරමුදල් ගිණුම්වලින් එකී අරමුණුවලින් බැහැරව රු.මිලියන53,594.67ක් රජයේ විවිධ අවශ්‍යතා සඳහා ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය වන විට මෙම මුදලින් රු.මිලියන53,294.97(පොලී සහිතව) තවදුරටත් අයවීමට තිබුණි. | රජයේ ප්‍රතිපත්ති තීරණ ක්‍රියාත්මක කිරීමට සහාය දැක්වීමේ පදනම මත මෙම ක්‍රියාත්මක කර ඇති 2013 අගෝ/සැප්/ඔක් සමෘද්ධි සහනාධාර ගෙවීම, වන්දි පාරිතෝෂිත ගෙවීම, කොවිඩ් නිසා පීඩාවට පත්වූවන්ට රු.5,000දීමනාව ගෙවීමට දරණ ලද වියදම ප්‍රතිපූරණය භාණ්ඩාගාරය එකගවී ඇති ගණුදෙනුය. මෙම සියළු ගණුදෙනුවල යම් ප්‍රමාණයන් මේවනවිට ප්‍රතිපූරණය කර ඇති අතර ඉතිරිය ප්‍රතිපූරණය කර ගැනීම සඳහා කැබිනට් සංදේශයක් ද ඉදිරිපත් කර ඇත. | සමෘද්ධිලාභීන්ගේ සුභ සිද්ධිය වෙනුවෙන් ඔවුන්ගේ සහනාධාර මුදලින් ගොඩ නැගී ඇති අරමුදල් අදාල අරමුණට යෙදවීමට කටයුතු කල යුතු අතර අදාල මුදල් ප්‍රතිපූර්ණය කර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

## 3.5 විදේශ ආධාර ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වත්මන් ආර්ථික අර්බුදයේ බලපෑම අවම කිරීම සහ සමාජ ස්ථාවරත්වය ප්‍රතිස්ථාපනය කිරීම සඳහා ලෝක බැංකු ආධාර යටතේ 2022 මූල්‍ය සහනාධාර වශයෙන් රු.මිලියන39,640 ක මුදලක් ලබාදී තිබූ අතර ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |

| | | | |
|---|---|---|---|
| (i) | දත්ත පද්ධතිය අනුව සමෘද්ධි පොරොත්තු ලේඛනගත සංඛ්‍යාව අනුව බැංකු වෙත මුදල් යවා තිබුණද මැයි, ජූනි හා ජූලි මාසවල 78,604 ක්වූ ප්‍රතිලාභීන්ගේ ගිණුම් විවිධ හේතු මත බැංකුව විසින් ඉවත් කර තිබුණද එම ප්‍රතිලාභීන්ටද මුදල් යවා තිබුණි. දෙපාර්තමේන්තුව සතු දත්ත පද්ධතිය නිවැරදිව යාවත්කාලීන නොවීම මේ සඳහා හේතු වී තිබුණි. | ප්‍රතිලාභීන්ට මුදල් බැර කරනු ලබන අවස්ථාව වනවිට ද්විත්ව ගෙවීම් වැළැක්වීමට තීරණයක් ගෙන නොතිබුණු බැවින් මුදල් බැරකිරීම මූලික ලේඛන අනුවම සිදු කර ඇත. වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී මතු වූ ප්‍රායෝගික දුෂ්කරතා රැසක බලපෑම නිරීක්ෂණයෙහි පෙන්වා දී ඇති තත්වයට හේතු වී ඇති අතර දත්ත පද්ධතිය යාවත්කාලීන නොවීම යන කරුණට පමණක් එය සීමා කළ නොහැකිය. | දෙපාර්තමේන්තුව සතු දත්ත පද්ධතිය යාවත්කාලීන කල යුතුය. |
| (ii) | සහනාධාර මුදල් බෙදාහැරීම සම්බන්ධයෙන් ප්‍රජාමූල බැංකු කිහිපයක සිදුකල නියැදි පරීක්ෂාවේදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 02 ක ප්‍රජාමූල බැංකු දෙකක් විසින් මූල්‍ය සහනාධාර වශයෙන් අතිරේක දීමනා එකතුව රු.55,529,060ක් දින 22 සිට දින 106 ක් වැනි කාල පරාසයක් ප්‍රතිලාභීන් වෙත ලබා නොදී ප්‍රජාමූල බැංකුවල රඳවා ගැනීමට කටයුතු කර තිබුණි. | මෙම තත්වය වළක්වා ගැනීමට අවශ්‍ය උපදෙස් සමෘද්ධි ප්‍රජාමූල බැංකු වෙත නිකුත් කර ඇත. ඒ අනුව ප්‍රතිලාභ ලද වහාම ප්‍රතිලාභීන්ගේ ගිණුම්වලට බැරකිරීමට පියවර ගන්නා ලෙස දන්වා මෙම තත්වය වැළැක්වීමට කටයුතු කර ඇත. | ප්‍රතිලාභ අප්‍රමාදීව ප්‍රතිලාභීන්ගේ ගිණුම්වලට බැරකිරීමට කටයුතු කල යුතුය. |

## 3.6 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්ඩී/08/2019 රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව රාජ්‍ය ආයතන 2020 වර්ෂයේ සිට විද්‍යුත් ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුගත විය යුතු අතර දෙපාර්තමේන්තුව විසින් ජාතික විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන පද්ධතියෙහි ලියාපදිංචි වියයුතු වේ. නමුත් මෙම වාර්තාවේ | ඉදිරියේදී ජාතික විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන පද්ධතියෙහි ලියාපදිංචිවීම සඳහා කටයුතු කරමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දිනය දක්වාම දෙපාර්තමේන්තුව ලියාපදිංචි වී නොතිබුණි. වෙළඳපල මිල සැදහුම් ක්‍රමය යටතේ කරනු ලබන මිලදී ගැනීම් 2020 වර්ෂයේ සිට විද්‍යුත් ප්‍රසම්පාදන ක්‍රමය හරහා සිදුකළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ඇ) සහ 4.2.2 (අ) ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව සහ ප්‍රසම්පාදන කාල සටහන ඇතුළත් වන පරිදි පිළියෙළ කර නොතිබුණි. | උපදෙස් ප්‍රකාරව ප්‍රසම්පාදන සැලසුම් පිළියෙල කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස විෂය නිලධාරීන්ට උපදෙස් ලබාදෙන ලදී. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 3.7 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දින වන විට මෘදුකාංගය මිලදී ගැනීම ඇතුළුව “e” පුවත්පත එළිදැක්වීම සඳහා රු7,723,900ක් වියදම් කර තිබුණි.2022 අවසන් කාර්තුව වන විට e පුවත්පත පරිශීලනය කරන සංඛ්‍යාව 56,234ක් හා “e” පුවත්පත දුරකථන යෙදවුම (“e” paper app) භාවිතා කරන ප්‍රමාණය 21,565ක් හෙවත් එය මුළු සමෘද්ධිලාභීන්ගේ සියයට 4.6ක් වුයෙන් ක්‍රියාත්මක වීම ඉතා පහළ මට්ටමක පැවතුණි. | සමෘද්ධි ප්‍රතිලාභීන්ගෙන් සියයට 4.6 ක් ලෙස ගණනය කිරීම පරිශීලකයන් හා දුරකථන යෙදවුම ස්ථාපිත කිරීම තුලින් ලබා ගැනිම නිරවද්‍ය නොවේ. එයට හේතුව සමෘද්ධි වැඩසටහන් විවිධ අංශ ආශ්‍රිතව දිස්ත්‍රික් මට්ටමින් වට්ස්ඇප් සමූහ රුසක් තිබීම හේතුවෙන් මාසිකව “e” පුවත්පත එම වට්ස්ඇප් සමූහයට යොමු කිරීමයි. | මූලික අරමුණු හා ඉලක්ක වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීව ජනතාව අතරට සන්නිවේදනය කිරීමට සුදුසු වැඩපිළිවෙලක් සැකසිය යුතුය. |

## 3.8 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

දෙපාර්තමේන්තුව වෙත නිකුත් කරන ලද පහත විස්තර සඳහන් විගණන විමසුම් සඳහා 2023 ජූනි 09 දින වන විටත් පිළිතුරු එවා නොතිබුණි.

| විගණන විමසුම පිළිබඳ විස්තරය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී නිකුත් කරන ලද විගණන විමසුම් 12 ක් සඳහා පිළිතුරු ලබාදීමට ප්‍රමාද වීම මාස 01 සිට මාස 05 දක්වා කාල පරාසයක් වන අතර විගණන විමසුම් 05ක් සඳහා පිළිතුරු ලබා දී නොතිබුණි. එම විමසුම්වලට අදාළව ගණනය කල හැකි ගනුදෙනු වටිනාකම රු.4,254,728,365කි. | මේ වන විට සමාලෝචිත වර්ෂයට අදාල සියලු විගණන විමසුම් වලට පිළිතුරු ඉදිරිපත් කර ඇත. එසේම දිස්ත්‍රික් ලේකම් කාර්යාල/ ප්‍රදේශීය ලේකම් කාර්යාල හා දෙපාර්තමේන්තුව හා සම්බන්ධ අනිකුත් ආයතන වලින් පිළිතුරු හා පැහැදිලි කිරීම් ලබාගෙන විමසුම් සඳහා පිළිතුරු ඉදිරිපත් කළ යුතු බැවින් කාල පමාවක් පවතින බව පිළිගනිමි. | විගණන විමසුම් වලට වහාම පිළිතුරු ලබාදීමට කටයුතු කල යුතුය. |

## 3.9 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) ප්‍රතිලාභි කළමනාකරන මොඩියුලය** | | |
| 2012 වර්ෂයේදී ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය විසින් නිර්මාණය කරන ලද සමෘද්ධිලාභීන් හා අඩු ආදායම්ලාභින්ගේ තොරතුරු ඇතුළත් කළමනාකරණ මොඩියුලය ආශ්‍රයෙන් දත්ත පද්ධතිය සංවර්ධනය කිරීමේ “e” - සමෘද්ධි ව්‍යාපෘතියට 2016 වර්ෂයේ දී රු. මිලියන4.3ක වියදමක් දරා තිබූ අතර, 2019 වර්ෂයේදී නැවත CRM මොඩියුලය සඳහා රු.මිලියන4.07ක් වැයකර තිබුණි. නමුත් 2023 වර්ෂය වන විටත් පහත සඳහන් උප මොඩියුලය තොරතුරු ඇතුලත් කොට පද්ධතිය යාවත්කාලීන කර නොතිබුණි. | මෙම මොඩියුල නිර්මාණය කිරීමෙන් පසුව, ඒවා ක්‍රියාත්මක කිරීම අඛණ්ඩව සිදු කිරීම සඳහා, මෙම මොඩියුල නිර්මාණය කරන ලද ආයතන සමඟ නඩත්තු කිරීම සහ සේවා සැපයීම සම්බන්ධ ගිවිසුම් ක්‍රියාවලියක් ICTA විසින් හඳුන්වා දී නොතිබූ අතර සමෘද්ධි අධිකාරිය දෙපාර්තමේන්තුවක් බවට පත්වීමෙන් අනතුරුව කළමනාකරණයේ සිදු වූ වෙනස් කම් හේතුවෙන් ද එක් එක් මොඩියුලය නිසි ලෙස අඛණ්ඩව පවත්වා ගෙන යාමට නොහැකි විය. | ප්‍රතිලාභි කළමනාකරන මොඩියුලය යාවත්කාලීනව පවත්වා ගත යුතුය. |

| | |
|---|---|
| • ජලය හා විදුලිය පරිභෝජන තොරතුරු ඇතුළත් කර නොතිබුණි. | • මෙම කාර්ය සැලසුම් කල කාලයේ අනෙකුත් සහනාධාර වර්ග (වැඩිහිටි, වකුගඩු සහ ආබාධිත) සඳහා සමෘද්ධි බැංකු හරහා ගෙවීම් සිදු කිරීමට සිදු වූ බැවින් කාර්ය බහුලවීම මත තොරතුරු එක් රැස්කිරීම කල් දමන ලදි. |
| • COVID -19 සහනාධාර ලබාදීම සම්බන්ධ තොරතුරු ඇතුලත් කර නොතිබුණි. | • Covid-19 වසංගත අවස්ථාවේ සිදු කරන ලද රු.5,000 දීමනාවට අදාල පුද්ගලයන් 2,376,826කගේ තොරතුරු ඇතුලත් කර ඇත. |
| • ජීවනෝපාය ව්‍යාපෘතිවල වර්තමාන ප්‍රගතිය හා ක්‍රියාත්මක තත්ත්වය සහ ප්‍රතිලාභින් සවිබල ගැන්වී ඇති ආකාරය පිළිබඳ තොරතුරු ඇතුළත් කර නොතිබුණි. | • සෑම ප්‍රාදේශීය කාර්යාලයකම සමාජ සේවා නිලධාරියාට පද්ධතියට පිවිසීමට පරිශීලක නාම සකස් කර පුහුණුවක්ද සමඟින් ලබා දුන්නද අදාල ආයතන දෙක (වැඩිහිටි සහ ආබාධිත මහ ලේකම් කාර්යාල) තොරතුරු යාවත්කාලීනව පවත්වාගෙන යෑම සිදු නොකරන ලදි. |
| • පද්ධතිය යාවත්කාලීන නොකිරීම නිසා 2018 සිට 2021 ඔක්තෝබර් දක්වා ප්‍රතිලාභීන් 309 ගේ සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි ත්‍යාග මුදල් රු.මිලියන 61.8 ක් අත්හිටුවීමට සිදු විම. | • 2018 සිට 2021 ජූනි වන තෙක් CRM මොඩියුලයේ දත්ත නිවාස ලොතරැයිය දිනුම් ඇදීම සඳහා යොදා ගනු නොලැබුණි. මාස 06 කට වරක් Excel ගොණු මඟින් දත්ත රැස් කර දිනුම් ඇදීමට භාවිතා කිරීම හේතුවෙන් මෙම ඉතිරිවීම සිදුවී ඇත. |
| • වැඩිහිටි, ආබාධිත සහ වකුගඩු ප්‍රතිලාභීන් පිළිබඳ තොරතුරු ඇතුලත් වී නොතිබුණි. | • මේ සඳහා අවශ්‍ය සහාය ඉහත දීමනා සඳහා වන ආයතන දෙකෙන් නොලැබුණි. |
| • මාසික සහනාධාර මුදල් ප්‍රාදේශීය කාර්යාල වෙත යැවීමේදී නිවැරදි දත්ත ලබා ගත නොහැකි නිසා සහනාධාර මුදල් වැඩිපුර යවා තිබීම. | • CRM මොඩියුලය මඟින් ඉතා නිවැරදි වාර්තාවක් සකස් කරනු ලැබේ. මෙම මොඩියුලය ක්‍රියාත්මක කිරීමත් සමඟ ඉතා සුළු මුදලක් ඉතිරිවීම් නිරීක්ෂණය විය. |

(ආ) **මානව සම්පත් කළමනාකරණ මොඩියුලය**

| | | |
|---|---|---|
| සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ මානව සම්පත් කටයුතු වඩාත් කාර්යක්ෂමව කිරීමේ අරමුණෙන් මානව සම්පත් කළමනාකරණ මොඩියුලය ආරම්භ කර තිබුණි. මෙම වාර්තවේ දින වන විට දෙපාර්තමේන්තු සේවක සංඛ්‍යාව 25,235ක ගෙන් සියයට 97 ක මූලික තොරතුරු පමණක් ඇතුළත් කර තිබුණි. අධ්‍යාපන සහතික ඇතුළු වැදගත් ලියකියවිලි පරිලෝකනගත කර පුද්ගලික ලිපිගොනු 306 ක් පමණක් සම්පූර්ණ කර තිබුණි. ඒ අනුව 2021 හඳුන්වාදුන් මෙම පද්ධතියේ ක්‍රියාකාරීත්වය 2023 වන විටත් මූලික අදියරයේ පැවතුණි. | 2021 වර්ෂයේ මූලික පියවරයන් සංවර්ධනය කර භාවිතය සඳහා ලබා දුන් අතර පුද්ගලික ලිපි ගොනු ඇතුලත් කිරීමේ මොඩියුල 2022 වසරේ මැද සිට ආරම්භ කරන ලදි. මේ වන විට අදාල නිලධාරීන්ට පුහුණු වීම් Zoom තාක්ෂණය ඔස්සේ ලබා දී ඇති අතර විශ්‍රාම ගැන්වෙන පිළිවෙලට අදාලව පුද්ගලික ලිපිගොණු පද්ධතියට ඇතුල් කිරීම ආරම්භ කර ඇත. | මානව සම්පත් කළමනාකරණ මොඩියුලය යාවත්කාලීනව පවත්වා ගත යුතුය. |

(ඇ) **ප්‍රජාමූල බැංකු පරිගණක පද්ධතිය**

| | | |
|---|---|---|
| සමෘද්ධි ප්‍රජා මූල බැංකු ගණුදෙණු කාර්‍යක්ෂමව කිරීම සඳහා **Soft Watch** හා **SLTS** වශයෙන් මෘදුකාංග දෙකක් හඳුන්වා දී තිබුණි. සමෘද්ධි බැංකු ශාඛා 1026 ක් මෙම මෘදුකාංගය භාවිතා කරනු ලබන අතර ප්‍රධාන කාර්යාලය සමඟ ඒකාබද්ධ නොවූ ශාඛා 12 ක් විසින් වසර 10 ටත් වඩා පැරණි මෘදුකාංගයකින් කටයුතු සිදු කරනු ලබයි. පද්ධතිය ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් ප්‍රජා මූල බැංකු 09 ක සිදුකල නියැදි පරීක්ෂාවේදී පහත අඩුපාඩු පවතින බව නිරීක්ෂණය විය.<br><br>දිනකට සීමිත මුදල් ගෙවීම් ප්‍රමාණයක් පමණක් ක්‍රියාත්මක කළ හැකි වීම තුළින් පද්ධතිය මන්දගාමී වීම, ණය අයවීමේදී ක්‍රමවත් බවක් නොවීම, ගිණුම් ශේෂ නිවැරදි නොවීම, පෙර ගනුදෙනු පරීක්ෂා කළ නොහැකි වීම, පරිගණක පද්ධතිය විටෙන් විට බිඳ වැටීම, බැංකුවේ සජීවි දත්තවලට ඇතුල් වීමේ හැකියාව මෘදුකාංග ආයතනයට තිබීම හේතුවෙන් දත්ත වෙනස්කල අවස්ථා පැවතීම හා පරිගණක පද්ධතිය මඟින් සහනාධාරලාභීන්ගේ ගිණුම්වලට බැරවන මුදල් වලින් ස්වයංක්‍රීයව ණය අය කර ගැනීමට ඉඩ පහසුකම් සලසා තිබීම හේතුවෙන් ප්‍රජාමූල බැංකු 05 කට අයත් සහනාධාරලාභීන් 173 දෙනෙකුගේ | මෙම සියලුම බැංකු වෙත නව online ආකාරයට ක්‍රියාත්මක මෘදුකාංගය හඳුන්වා දී ඇත. බැංකු මෘදුකාංගයේ ස්වයංක්‍රීයව ණය අයකල හැකි වුවද සහනාධාර සඳහා ලැබෙන මුදල් ප්‍රතිලාභියාගේ අනුමැතියකින් තොරව ණය සඳහා හිලවු කල නොහැකිය. එම මුදල් ණය අයවීමේදී මෘදුකාංගය තුල hold කරන අතර ස්වයංක්‍රීයව ණය අයවීමේදී එම මුදල් ණයට හිලව් වීමක් නොවේ. නමුත් ප්‍රතිලාභියාගේ අනුමැතිය මත කළමණාකරුවන් විසින් එම hold කිරීම ඉවත් කර ණයට හිලව් කර ගනී. බැංකු විසින් මෘදුකාංගය භාවිතයේදී පද්ධතිය තුල සිදුකරන අඩුපාඩු සකස් කිරීම සඳහා සේවාදායක ආයතන වෙත දත්ත පද්ධතියට පිවිසීමට අවශ්‍ය අවසරය දෙපාර්තමේන්තුව මඟින් ලබා දී ඇත. මෙහිදී දත්ත වෙනස් කිරීමට අවස්ථාව ලබා දී ඇත්තේ අදාල බැංකුවේ හා දෙපාර්තමේන්තුවේ පූර්ණ අනුදැනුම මත පමණි. එම සේවා සේවා සපයන ආයතනය මඟින් ලබා ගැනීමට ප්‍රධානතම හේතුව Software engineers හෝ | ප්‍රතිලාභීන්ට කාර්යක්ෂම සේවාවක් ලබාගැනීමට හැකිවන පරිදි බැංකු පරිගණක පද්ධතිය යාවත්කාලීනව පවත්වා ගත යුතුය. |

| | |
|---|---|
| ගිණුම්වලට බැර වූ සහනාධාර මුදල් රු.3,857,777ක් ණය වාරික ලෙස අය වී තිබු අවස්ථා නියැදි විගණනයේදී නිරික්ෂණය විය. | database administrators දෙපාර්තමේන්තුව සතු නොවීමයි. එම ආයතන වලද තෝරාගත් නිලධාරීන් කීපදෙනෙකුට පමණක් එම අවස්ථා සපයා ඇත. |

## 3.10 2016 දෙසැම්බර් 16 දින පැවති කාරක සභාවේදී දී ඇති නියෝග ක්‍රියාත්මක නොකිරීම

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **නියෝග අංක 7.3** | | |
| දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් අවස්ථා 6 කදී රු. මිලියන54.02 ක මුද්‍රිත කටයුතු අදාළ මුදල් රෙගුලාසි වලින් බැහැරව සිදුකිරිම සම්බන්ධයෙන් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදුකොට වාර්තාවක් ඉදිරිපත් කිරිමට නියෝග කිරිම සම්බන්ධයෙන් අභ්‍යන්තර පරීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් නොවිය. | 2018 සැප්තැම්බර් 28 දිනැතිව අමාත්‍යාංශයේ කමිටුව මගින් සිදු කරන ලද පරීක්ෂණ වාර්තාවේ නිර්දේශ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර නොමැති බැවින් නැවතත් මෙම කරුණ සම්බන්ධයෙන් සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මුල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරන ලද අතිරේක ලේකම් වරයකුගේ සභාපතිත්වයෙන් යුත් සමාජිකයන් තිදෙනෙකු ගෙන් සමන්විත කමිටුවක් පත් කර අදාල පරීක්ෂණය සිදු කරමින් පවතී. | අභ්‍යන්තර පරීක්ෂණ කඩිනමින් අවසන් කල යුතුය. |
| **නියෝග අංක 9.1** | | |
| මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව රු106,873,148ක මුදලක් වැය කර ජල බහාලන බඳුන් මිළ දී ගැනීම, තොරතුරු විගණයට ඉදිරිපත් නොකිරීම සහ ප්‍රවාහනය සඳහා මිළ ගණන් කැඳවීමකින් තොරව ආයතන තෝරා ගැනීම සහ ගෙවීම් සිදු කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශයෙන් අදාළ මූලික විමර්ශන සිදුකරමින් පවතින බව සඳහන් කර ඇතත් මිලදීගැනීම් වලට අදාල තොරතුරු විගණනයට ඉදිරිපත් නොවිය. | IRM/Ad1/මු.වි/21/ප්‍රතික්ශේප අංක දරණ හා 2019 ජුනි 26 දාතමින් යුත් ලිපිය මගින් රාජ්‍ය පරිපාලන, ආපදා කළමණාකරණ සහ ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය මගින් ආදාල මුලික විමර්ෂණය ප්‍රමාණවත් නිලධාරීන් නොමැති බැවින් කළ නොහැකි බව දන්වා ඇත. ඒ අනුව මෙම පරීක්ෂණය අමාත්‍යාංශයෙන් අදාල මුලික විමර්ෂණය සිදු කරමින් පවතී. | මූලික විමර්ශණය කඩිනමින් අවසන් කර මිලදීගැනීම් වලට අදාල තොරතුරු විගණනයට ඉදිරිපත් කල යුතුය. |

**නියෝග අංක 9.4**

| | | |
|---|---|---|
| දිවි නැගුම සම්මේලන සඳහා රු16,629,435කට මිලදීගත් උපකරණ හා පුටු ඇතුළු යටිතල පහසුකම් සහ ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් රු.1,954,300ක් වැය කිරීම හා එකතුව රු.16,629,475ක් වූ උපකරණ සහ පුටු බෙදාදීම සම්බන්ධයෙන් මේ වන විටත් විගණනයට තොරතුරු ලබා දී නොතිබුණි. | කැම්බල් පිටියේ පැවති සම්මේලනය සඳහා මෙම වියදම් දරා ඇත. ලබා ගත් පුටු 10,000 පසුව ගාල්ල, හම්බන්තොට, කුරුණෑගල සහ මහනුවර දිස්ත්‍රික් වල සමෘද්ධි බැංකු සංගම් සඳහා ලබා දීමට කටයුතු කර ඇත. එම පුටු ලැබීම් සම්බන්ධව දිස්ත්‍රික්ක මට්ටමින් තොරතුරු ගෙන්වා ගෙන ඉදිරිපත් කිරීමට කටයුතු සුදානම් කර ඇත. | උපකරණ සහ පුටු බෙදාදීම සම්බන්ධයෙන් විගණනයට තොරතුරු ඉදිරිපත් කල යුතුය. |

**නියෝග අංක 9.5**

| | | |
|---|---|---|
| දිවිනැගුම ලිත් 5,000,000 මුද්‍රණය කිරීම සඳහා රු.29,400,000ක වැය කිරීම සහ සියළු මුද්‍රණයන් බෙදා හැර ඇති බවට විගණනයට තහවුරු නොකිරීම සම්බන්ධයෙන් මේ දක්වා අභ්‍යන්තර පරීක්ෂණ කටයුතු පිළිබඳ වාර්තා ඉදිරිපත් නොවිය. | මෙම කරුණ සම්බන්ධයෙන් සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරන ලද අතිරේක ලේකම්වරයකුගේ සභාපතිත්වයෙන් යුත් සමාජියන් 03 ගෙන් සමන්විත කමිටුවක් පත් කර අදාල පරීක්ෂණය සිදු කරමින් පවතී. | පරීක්ෂණ කටයුතු කඩිනමින් අවසන් කල යුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

2022 දෙසැම්බර් 31 දිනට අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩලය පහත සඳහන් පරිදි විය.

| | 2022.12.31 දිනට | | | |
|---|---|---|---|---|
| **වර්ගීකරණ** | **අනුමත** | **තත්‍ය** | **පුරප්පාඩු** | **අතිරික්ත** |
| ජ්‍යෙෂ්ඨ | 108 | 79 | 29 | - |
| තෘතියික | 1942 | 1646 | 296 | - |
| ද්විතියික | 25,509 | 23,339 | 2170 | 2485 |
| ප්‍රාථමික | 516 | 417 | 99 | 6 |
| එකතුව | -------- | ------- | ------- | ------ |
| | 28,075 | 25,481 | 2594 | 2491 |
| | ==== | ==== | ==== | ==== |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජයේ ප්‍රතිපත්තිමය තිරණ මත උපාධිධාරී සංවර්ධන නිලධාරීන් 2,287 ක් අනුයුක්ත කර තිබු අතර ඒ අනුව අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම සමෘද්ධි කළමනාකරු තනතුර සඳහා අනුමත ප්‍රමාණය ඉක්මවා 132ක් බඳවාගෙන තිබුණි. | රජය විසින් ක්‍රියාත්මක කරන ලද වැඩ සටහන අනුව මෙම දෙපාර්තමේන්තුව සඳහා ද උපාධිධාරී සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කර ඇත. ඒ අනුව 2022 වර්ෂයේදී කාර්ය මණ්ඩලය අතිරික්ත වීමට හේතු වී ඇත. ඒ අනුව 2021 සැප්තැම්බර් 15 දිනැති ලිපියෙන් මෙම සංඛ්‍යාව නිවැරදි කර අනුමැතිය ලබා ගැනීම සඳහා කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් කර ඇත. මෙතෙක් අනුමැතිය ලැබී නොමැත. | පරිපාලන ගැටළු විසඳා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | ප්‍රධාන කාර්යාලයේ කාර්යභාරය ,දිස්ත්‍රික් කාර්යාල වල කාර්යභාරය දිස්ත්‍රික්කය යටතේ ඇති එක් එක් ප්‍රජාමූල බැංකු කලාපවල කාර්යය නිලධාරියාගේ තනතුර අනුව කලයුතු කාර්යභාරය පිළිබඳ කාර්යමණ්ඩල සමාලෝචනයකින් තොරව අනුයුක්ත කිරිම් සිදුකර තිබුණි. | සමෘද්ධි කළමනාකරුවන් 100ක් ප්‍රධාන කාර්යාලයට දැනට අනුමත කර ඇති අතර, එම නිලධාරින් කාර්යාල කටයුතු සඳහා යොදවා ගෙන ඇත. මේ වනවිට සිටින ප්‍රධාන කාර්යාලයට අනුයුක්ත සමෘද්ධි කළමනාකරුවන් 97 දෙනෙකු සිටි. නිලධාරින් 02 කු ජනාධිපති ලේකම් කාර්යාලයට නිදහස් කර ඇති අතර, පුහුණු මධ්‍යස්ථානවල සමෘද්ධි කළමනාකරුවන් 06 දෙනෙකු අනුයුක්තව සේවය කරනු ලැබේ. | කාර්යමණ්ඩල සමාලෝචනයක් කර අනුයුක්ත කිරිම් කල යුතුය. |
| (ඇ) | සමෘද්ධි කළමනාකරු තනතුර දරන නිලධාරීන් 108 දෙනෙකු ප්‍රධාන කාර්යාලයට අනුයුක්ත කර තිබුණි. නමුත් ප්‍රජාමූල බැංකු වල වැඩ බලන හා වැඩ ආවරණය සඳහා කළමනාකරුවන් වශයෙන් 123 දෙනෙකු බැංකු කාර්ය මණ්ඩලයට පත්කර වැඩබැලීමේ දීමනා වශයෙන් රු.4,096,380ක් 2022 වර්ෂය සඳහා ගෙවා තිබුණි. මේ අනුව දෙපාර්තමේන්තු කාර්යභාරය කාර්යක්ෂමව සිදුවන පරිදි කාර්ය මණ්ඩලය යොදවා නොමැති බව නිරික්ෂණය විය. | ප්‍රජාමූල බැංකුවල රාජකාරී ආවරණය සඳහා සමෘද්ධි කළමනාකරු වශයෙන් පත්වීම් ලබා දී නොමැති අතර, වැඩ බැලීමේ දීමනාවන් නොගෙවයි. මෙම නිලධාරීන් සඳහා ගමන් වියදම් හා සංයුක්ත දීමනාව පමණක් ගෙවනු ලබයි. වැඩබැලීමේ දීමනා ගෙවනු ලබන්නේ වසම්වල වල රාජකාරි ඉටුකරනු ලබන නිලධාරීන් සඳහා පමණි. | දෙපාර්තමේන්තු කාර්යභාරය කාර්යක්ෂමව සිදුවන පරිදි කාර්ය මණ්ඩලය යෙදවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2019 ජුලි 05 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය අනුව 2013 අංක 1 දරන දිවිනැගුම පනතේ 25 (3) වගන්තිය අනුව ප්‍රජාමුල බැංකු කාර්යමණ්ඩලය සඳහා විශ්‍රාම වැටුප් සහිත රාජ්‍ය සේවකයින් ස්ථිර පදනමින් පත්කිරිම නීතියට පටහැනි බව ගරු නීතිපති තුමා විසින් දැනුම් දී ඇති බවත්, ප්‍රජා මුල බැංකු සමිතිවල දැනටමත් සේවයේ යෙදී සිටින දිවි නැගුම පනතේ 44 (ඉ) හා ii යටතේ දෙපාර්තමේන්තුවේ සේවයට එක් වූ නිලධාරීන් තාවකාලික පදනමින් එම ආයතනවලට මුදා හැර ඇති බවට සැලකිය යුතු වන අතර, ඉදිරියේදී බැංකු කාර්ය මණ්ඩලය සඳහා වෙනම තනතුරු අනුමත කරවා ගැනීමටත් ඉන් අනතුරුව පුරප්පාඩු වන තනතුරු සඳහා ඒ අනුව බඳවා ගැනීම් කිරීමට කටයුතු කළ යුතු බව දැක්වුවද, මේ දක්වා ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. එසේම බැංකු කාර්ය මණ්ඩලය 7,605ක් සඳහා දෙපාර්තමේන්තු වැය විෂයයෙන් 2022 වර්ෂය සඳහා වැටුප් වශයෙන් ගෙවා ඇති මුදල රු.මිලියන 4,259.25ක් විය. | ප්‍රජාමූල බැංකුවල මේ වන විට සේවය කරන කාර්ය මණ්ඩලය ප්‍රජාමූල බැංකුවල සේවය සඳහා තාවකාලීන පදනම මත මුදාහැරීමේ කටයුතු ආරම්භ කර ඇති සේ සළකා කටයුතු කළ යුතුවේ. බැංකු කාර්ය මණ්ඩලය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමැතිය ඉල්ලා 2022 ජුනි 22, 2022 ඔක්තොම්බර් 20, 2022 ජනවාරි 17 හා 2022 දෙසැම්බර් 02 ලිපි යොමු කර ඇත. අනුමැතිය ලබාදීමෙන් පසුව මෙම නිලධාරින් ප්‍රජාමූල බැංකු සඳහා මුදා හැරීමට කටයුතු කරනු ලැබේ. | දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය වැඩිවන ලෙස අනුයුක්ත කිරීමට කටයුතු කල යුතුය. |
| (ඉ) | විශ්‍රාම වැටුපට හිමිකම් රහිතව සේවා නියුක්ත භාරකාර අරමුදලට හා සේවක අර්ථ සාධක අරමුදලට අඛණ්ඩව දායකත්වය දරමින් දෙපාර්තමේන්තු සේවයට එක් වූ නිලධාරීන් සඳහා උසස්වීමේ පරිපාටි අනුමත කිරිම මේ දක්වා නොහැකි වී ඇති අතර 2022 දෙසැම්බර් 31 දිනට එම සේවක සංඛ්‍යාව 546 ක් වන අතර එදිනට විශ්‍රාම ගැන්වූ සංඛ්‍යාව 41 ක් වී තිබුණි. | සේවක අර්ථසාධක අරමුදල යටතේ අඛණ්ඩ දායකත්වය දරණ සේවකයන්ගේ උසස්වීමේ පරිපාටි සඳහා අදාළ නිර්දේශ, අනුමැතිය ලබා ගැනීමට අමාත්‍යාංශ ලේකම් මඟින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. | කටයුතු කඩිනම් කර පරිපාලන ගැටළු විසඳා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | වාර්ෂික විසර්ජන පනත අනුව දෙපාර්තමේන්තුවේ තත්‍ය සේවක සංඛ්‍යාව 24,647 ක් ලෙස ඇස්තමේන්තුවේ දක්වා තිබුණ ද සත්‍ය වශයෙන් වැටුප් ගෙවන සංඛ්‍යාව 25,481 ක් විය. ඒ අනුව වාර්ෂික අයවැය ඇස්තමේන්තුවට ඇතුළත් නොවූ ඒකාබද්ධ සේවා වල නිළධාරීන් 445 දෙනෙකු හැර ඉතිරිය වූ 389 ක් වෙනුවෙන් වැටුප් ගෙවීම පිළිබඳ විගණනයේදී ප්‍රශ්න ගත විය. | නිරීක්ෂණයේ දක්වා ඇති අතිරේක කාර්යමණ්ඩලය රාජ්‍ය පරිපාලන වැය ශීර්ෂය වන 130 යටතේ ලබාදුන් ප්‍රතිපාදන වලින් වැටුප් ගෙවූ සංවර්ධන නිලධාරීන් වේ. | ඇස්තමේන්තු නිවැරදිව සකස් කල යුතුය. |